# ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යාපනික තක්සේරුව සහ ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

# Diploma in Educational Assessment and Evaluation (2025/2026)

**ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්මේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**පාඨමාලවේ ස්වභාවය**

විභාග/පරීක්ෂණ සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, පිළිතුරුපත් ඇගයීම හා ප්‍රතිඵල විශ්ලේෂණය වැනි කාර්යන් හි නිරත වන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ට වැදගත් වන, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (Sri Lanka Qualification Framework) තෙවන මට්ටමේ (SLQF Level 03) පාඨමාලාවකි.

**පාඨමාලාවේ අන්තර්ගතය**

1. මිනුම්, තක්සේරුව හා ඇගයීම පිළිබඳ භාවිත (Applications of Measurement, Assessment and Evaluation)
2. පරීක්‍ෂණ තැනීම හා විශ්ලේෂණය (Test Constructions and Analysis)
3. පරීක්ෂණ/විභාග පරිපාලනය (Test Administration)
4. තක්සේරු හා ඇගයීම් උපකරණ තැනීම (Developing Tools for Assessment and Evaluation)
5. අධ්‍යාපනික සංඛ්‍යානය සහ සංඛ්‍යානමය මෘදුකාංග භාවිතය (Practices of Educational Statistics and Statistical Software)

**අවශ්‍ය සුදුසුකම්**

1. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් එකවර විෂයයන් 03ම සමත් වී තිබීම

**සහ**

2. රාජ්‍ය/අර්ධ රාජ්‍ය/පුද්ගලික/ජාත්‍යන්තර පාසලක, පිරිවෙනක හෝ වෙනත් අධ්‍යාපනික ආයතනයක ගුරුවරයෙකු වීම

**හෝ**

රාජ්‍ය/ අර්ධ රාජ්‍ය/පුද්ගලික / ජාත්‍යන්තර පාසලක, පිරිවෙනක හෝ වෙනත් අධ්‍යාපනික ආයතනයක විදුහල්පතිවරයෙකු වීම.

**හෝ**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ගුරු උපදේශක සේවයේ නිලධාරියෙකු වීම

**හෝ**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරියෙකු වීම

**සහ**

2024.12.31 දිනට වයස අවුරුදු 50 ට අඩු වීම

| | |
|---|---|
| **කාල සීමාව** | - එක් අවුරුදු පාඨමාලාවකි (සති අන්ත සහ පාසල් නිවාඩු දින) |
| **මාධ්‍යය** | - සිංහල/ දෙමළ |
| **දේශන පැවැත්වීම** | - සම්මුඛ සැසි (Contact Sessions) 75% ක් හා මාර්ග ගත ක්‍රමයට (Online) 25% ක් ලෙස පැවැත් වේ |
| **තෝරා ගැනීමේ පදනම** | - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් හෝ ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් |
| **පාඨමාලා ගාස්තුව** | - රු. 50,000/= |
| **ලියාපදිංචි ගාස්තුව** | - රු 2,000/= |
| **ඉල්ලුම්පත්‍ර සඳහා ගාස්තුව** | - රු. 1,200/= (ආපසු ගෙවනු නොලැබේ) |

**අයදුම් කළ යුතු පිළිවෙළ**

**ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්**

- ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස https://www.exams.nie.lk/intakes/new යොමුව ඔස්සේ මාර්ගගතව පමණක් අයදුම්පත් යොමු කළ යුතු ය. මාර්ගගතව අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මගින් ලබා ගත හැක (https://www.exam.nie.lk/info/applying-for-new-enrollments)
- අවසානයේ සම්පූර්ණ කරන ලද අයදුම්පත බාගත (download) කර විදුහල්පති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඇතිව ඕනෑම මහජන බැංකු ශාඛාවක ඇති ජාතික අධ්‍යාපන ආයතනය තැන්පතු පත්‍රිකාව භාවිත කර රු. 1,200ක මුදලක් තැන්පත් කර එහි රිසිට්පත අයදුම්පතෙහි අලවා ඔබගේ නම, ලිපිනය සහිත රු.110.00ක මුද්දර ඇලවූ 9" X 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග **"පාඨමාලා සම්බන්ධීකාරක, විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම"** යන ලිපිනයට 2024 දෙසැම්බර් මස 31 වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර **"DEAE-2025/2026"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**